## (7) සම්ඵප්‍රලාපය

යම් කථාවක් එය කියවන්නා වූ ද, අසන්නා වූ ද, තැනැත්තන්ගේ මෙලොව පරලොව යහපතට හේතු නොවේ ද? හුදෙක් කෙලෙස් වැඩීමටත්, යම්කිසි යහපතක් සිදුකර ගැනීමට තිබෙන කාලය නිකම් ම ගෙවී යාමටත් පමණක් හේතු වේ ද, ඒ කථාව සම්ඵප්‍රලාප නම් වේ. සම්ඵප්‍රලාප කීම් වශයෙන් ඇති වන්නා වූ අකුශල චේතනා සංඛ්‍යාත කර්මයට ද මේ කර්ම කතාවෙහි සම්ඵප්‍රලාප යන වචන ම කියනු ලැබේ.

(1) අසන කියන දෙපක්ෂයට ම වැඩක් නැති කථාවක් කියන අදහස ය. (2) එ බඳු කථාවක් කීමය අය අඞ්ග දෙකින් සම්ඵප්‍රලාප අකුශලය සිදු වේ. සම්ඵප්‍රලාප කියන තැනැත්තේ අනුන්ගේ කාලය නසන්නෙකි. අන්‍යයන් කෙරෙහි කෙලෙස් වැඩි කරන්නෙකි. එබැවින් සම්ඵප්‍රලාප කීම පාපයකි. ඇතැමුන් කාලය ගත කරනු පිණිස තැන් තැන්වලට එක් වී කරන්නා වූ නිෂ්ඵල කතාවෝ ද, අසන කියන කාහටවත් අවැඩක් මුත් වැඩක් නොවන, බොරු සැබෑ දෙර්ගය ම මිශ්‍ර කර ගොතා තිබෙන ''රාම - රාවණා'' කථාව වැනි කථාවෝ ද, අල්පමාත්‍ර සත්‍යකුදු නැති සාවාගේ හා නරියාගේ කථාව වැනි කථාවෝ ද සම්ඵප්‍රලාපයෝ ය. යම් කිසි උපදේශයක් උගැන්වීම සඳහා ගොතා තිබෙන කථා අසත්‍ය වුව ද, ප්‍රයෝජනයක් ඇති බැවින් සම්ඵප්‍රලාප සංඛ්‍යාවට නො ගැනේ. කියනලද සම්ඵප්‍රලාපය අන්‍යයන් පිළිගත හොත් කර්මපථයක් වේ. කිසිවකු නො පිළිගත හොත් කර්මපථ නො වේ. සාමාන්‍යයෙන් සම්ඵප්‍රලාප කීම අල්පසාවද්‍ය වේ. නැවත නැවත වර්ණනා කර රසවත් කර කීම මහා සාවද්‍ය වේ. අසන්නවුන්ට වන්නා වූ අර්ථ හානියේ කුඩා මහත් බවේ සැටියට ද එහි අල්පසාවද්‍ය මහා සාවද්‍ය භාවය කිය යුතු ය.

## (8) අභිද්‍යාව

අනුන්ගේ සම්පත් දැක ඒවා තමාට වේවා යි සිතීම හෙවත් අන්සතු දෑ අයිතිකර ගැනුමට සිතීම අභිද්‍යා නම් වේ. තමාගේ භාණ්ඩ පිළිබඳ ලෝභය ද පාපයකි. පරභාණ්ඩයක් ගැන කරන්නා වූ ලෝභය, පමණ ඉක්මවා පවත්වන අධර්ම ලෝභයක් වන බැවින් එය අභිද්‍යා නම් වූ අකුශල කර්ම පථය වේ. මෙය බොහෝ සෙයින් අදත්තාදාන කාමමිථ්‍යාචාර කර්මයන්ගේ පූර්වභාගයෙහි ඇති වන්නකි. අභිද්‍යාව නිසා සොරකම් කරති. පරදාර සේවනය කරති. දූ කෙළිය ද අභිද්‍යාව නිසා කරන්නකි. (1) අන් සතු වස්තුවක් වීමය (2) එය අයත් කරගන්නට සිතීමය යන අඞ්ග දෙකින් අභිද්‍යා නම් වූ අකුශල මනඃකර්මය සිදු වේ. ලෝභනීය වස්තුවක් දැක මෙය කොපමණ හොඳ ද යනාදීන් සිතූ පමණින් අභිද්‍යා කර්මය නොවේ. මා විසින් ද මෙවැන්නක් ලබා ගන්නට ඕනෑය යි සිතීමෙන් ද අභිද්‍යා කර්මය නො වේ. මෙය මට වුවහොත් හොඳය කියා හෝ මට අයිති වේවා ය කියා හෝ සිතූ කල්හි කර්මය වේ. එහි අල්පසාවද්‍ය මහාසාවද්‍යතාව හා විපාක ද අදත්තාදාන කර්මයෙහි මෙන් දත යුතු ය. දම්පියා අටුවාවේ චිත්ත වර්ග වර්ණනාවේ දැක්වෙන සෝරෙය්‍ය ස්ථවිරයන් වහන්සේගේ කථාව මෙහිලා සැලකිය යුතු ය.

## (9) ව්‍යාපාදය

අන්‍යයෝ නැසෙත්වා යි සිතීම ව්‍යාපාද නම් වේ. මෙය බොහෝ සෙයින් ඊර්ෂ්‍යාව මුල්කොට ඇතිවන පාපයකි. අනුන් මළ කල්හි ඔවුන්ගේ වස්තුව තමාට හිමිවීම ගැන බලාපොරොත්තුවෙන් අනුන් ගැන එසේ සිතන්නෝ ද වෙති. ඔවුන්ගේ ඒ ව්‍යාපාදය ලෝභය නිසා ඇතිවන්නකි. සමහරවිට තමාට කරදර කරන්නෝ නැසෙත්වායි ද සිතති. එය ද්වේෂය නිසා සිදුවන්නකි. (1) අන්‍ය සත්ත්වයකු වීමය (2) ඔහුගේ විනාශය සිතීමය යන අඞ්ග දෙකින් ව්‍යාපාද කර්මය සිදු වේ. අනුන් කෙරෙහි කෝපය ඇති වූ පමණින් ම ව්‍යාපාද කර්මය සිදු නොවේ. නැසෙත්වා යි සිතූ කල්හි කර්මය සිදු වේ. එහි අල්ප සාවද්‍ය මහාසාවද්‍ය භාවය හා විපාක පරුෂ වචන කර්මයෙහි මෙන් දත යුතු ය.